**ශීර්ෂ අංක 233 - රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**
----------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධි විධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධි විධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟ හැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතාව පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

**(ආ)** රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) යථෝක්ත චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාර මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී එම වත්කම්වල ප්‍රධාන ලෙජර් ශේෂවල වටිනාකම, කේවල වත්කම් ශේෂවල වටිනාකම් සමඟ පරීක්ෂා කර බලා එම වටිනාකම් සැසඳෙන බවට ගණන්දීමේ නිලධාරි තහවුරු කිරීම කළ යුතුය. කෙසේ වෙතත් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල ලෙජර් ශේෂ වටිනාකම් හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබෙන ලෙජර් ශේෂ වටිනාකම් අතර එකතුව රු.37,450,791 ක වෙනස්කම් පැවතිබව නිරීක්ෂණය විය. | සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ නිවැරදි වාර්තාවක් භාණ්ඩාගාරයට ඉදිරිපත් කර එමගින් ලබා ගන්නා ප්‍රධාන ලේජර් ශේෂ සමඟ දෙපාර්තමේන්තු ප්‍රධාන ලෙජර් ශේෂ සහ කේවල ශේෂ ලැයිස්තු එකඟ වන ලෙස ලේඛන පවත්වාගෙන යා යුතුවේ. | මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් වන ඒසීඒ - 6 ආකෘතිය මගින් දක්වා ඇත්තේ භෞතික වශයෙන් දෙපාර්තමේන්තුව තුල පවතින වත්කම් සහ ස්ථාවර වත්කම් ලේඛනයට අනුව සඳහන් වන වත්කම් වල වටිනාකමයි.පරිගණක වැඩසටහනට ස්ථාවර වත්කම් දත්ත ඇතුලත් කිරීමේ දී ප්‍රමාද දෝෂයකින් සමහර වත්කම් වල වටිනාකම දෙවරක් ඇතුලත් වී ඇති බැවින් මෙම වෙනස පෙන්නුම් කරයි. එසීඒ 6 ආකෘතිය මඟින් දක්වා ඇති වත්කම් වටිනාකම නිවැරදි වන අතර පරිගණක වැඩසටහනේ දත්ත මේ වන විට නිවැරදි කොට ඇති බව කාරුණිකව දන්වමි. |
| (ආ) චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (III) යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලැබූ බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ වියයුතු විය. එහෙත් දෙපාර්තමේන්තුවට අදාලව භාණ්ඩාගාර ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ බැදීම් හා බැරකම් ප්‍රකාශයේ හා මූල්‍ය | දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) යටතේ එක් එක් වැය විෂය සඳහා වන බැරකම් සියල්ල නිවැරදිව හඳුනා ගත යුතුය. එසේම එම බැරකම් භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශිර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශ සමඟ සැසඳී තිබිය යුතුවේ. | මුදල් රෙගුලාසි 94 (11) ප්‍රතිපාදනයන්ට අනුව පුනරාවර්තන ස්වභාවයේ වියදම් වෙනුවෙන් පසුගිය වර්ෂ තුනක සාමාන්‍යයෙන් සියයට 50 දක්වා බැරකම් වලට එළඹීමේ හැකියාවක් ඇත. එසේ වුවද භාණ්ඩාගාරය මඟින් ක්‍රියාත්මක කරනු ලබන New Cigas ගිණුම්කරණ මෘදුකාංගය යටතේ බැදීම් හා බැරකම් පෙන්නුම් කල හැකි වන්නේ වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන සීමාව තුල පමණි. එබැවින් මුදල් රෙගුලාසි වලට අනුව |

| | | |
|---|---|---|
| ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ සඳහන් වටිනාකම් අතර රු.4,250,343 ක වෙනසක් විය. | | එලඹෙන ලද බැරකම් වලින් කොටසක් New Cigas වැඩසටහන මඟින් පෙන්නුම් කරයි. |

**1.6.2** **බැරකම්**

----------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ----------------------- | ----------- | ------------------------------ |
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාලව රු.3,130,190 ක බැරකම් 2019 ජනවාරි හා පෙබරවාරි මාස වලදී නිරවුල් කර තිබුණද එම වටිනාකම් 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයෙහි බැරකම් හා බැඳීම් යටතේ වාර්තා කර නොතිබුණි. | සියළුම බැරකම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරිම කලයුතු වේ. | 2018 වර්ෂයට අදාල 2019 වර්ෂයේ ගෙවා තිබූ අංක 233 – 1 – 1 – 0 – 2401 හා අංක 233 – 1 – 1 – 0 – 1002 දරන වැය විෂයයන්ට අදාල රු. 3,130,190 ක මුදල අතපසුවීමකින් 2018 මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් ලෙස සටහන් කර නොතිබුණි. |

### 1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | 2018 වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව සකස් කර තිබූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ( ඒසීඒපී (**ACAP**) ආකෘතියේ ) මූල්‍ය නොවන වත්කම් යටතේ සඳහන් වත්කම් වටිනාකම සහ එම මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ **ACA – 6** ආකෘතියෙහි සඳහන් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වත්කම් වටිනාකම අතර රු.75,511,084 ක නොසැසඳීමක් පැවතුණි. | මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂයට වර්ෂයේ සිදුකල ගනුදෙනු සහ වෙනස්කම් ගලපා වර්ෂ අවසාන නිවැරදි ශේෂය ලබා ගැනීම කල යුතුවේ. | ප්‍රමාද දෝෂයකින් අපහරණය කරන ලද වාහන වල වටිනාකම ඒසීඒ 6 ආකෘතියේ සටහන් වී නොමැති අතර ඒ අනුව ඒසීඒ ආකෘතියේ සම්පූර්ණ වත්කම් වල වටිනාකම රු.2,248,744,768 ක් වශයෙන් නිවැරදි විය යුතුය. |
| **(ආ)** | දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද හානි පාඩු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය තුළ සිදු වී තිබූ රු.818,941 ක අලාභ හානි වලින් අවස්ථා දෙකකදී රු.352,479 ක හානි පාඩු අය කර ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් අය කර ගතයුතු ශේෂය රු.466,462 ක් විය. කෙසේ වෙතත් තවදුරටත් අය කර ගතයුතු පාඩු වල මුළු වටිනාකම රු.2,229,111 ක් ලෙස ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන්ව තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කළ පාඩු හානි ලේඛනය අනුව එම වටිනාකම රු.2,695,573 ක් විය. | හානි පාඩු ලේඛනයේ ඇතුලත් කළ යුතු තොරතුරු සියල්ල ඇතුලත් කර නිවැරදිව පවත්වා ගෙන යාම කල යුතු වේ. | විගණන නිරීක්ෂණ මඟින් දක්වා ඇති පරිදි හානි පාඩු ලේඛනය නිවැරදි කර ගැනිමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |

**1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104** | සමාලෝචිත වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 12 කට අදාලව අනතුරු සිදු වූ වහාම එම අනතුර සිදු වීමට අදාල හේතු නිශ්වය වශයෙන් දැන ගැනීමට සහ වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෝටර් වාහන අනතුරු සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්වය වශයෙන් දැන ගැනීමට සහ වගකිව යුතු පාර්ශව නිශ්වය කිරිම සඳහා පරික්ෂණයක් පැවැත්වීම කළ යුතුවේ. | 2018 වර්ෂයේ සිදු වී ඇති රිය අනතුරු 12 සඳහා හානි පූර්ණයට අදාල රක්ෂණ ආයතනය මඟින් ගෙවා ඇති මුදල් පිළිබඳ සඳහන් රිසිට් පත් අප වෙත නොලැබී තිබුණු බැවින් විගණන විමසුම් සිදු කරන අවස්ථාව වන විට මුදල් රෙගුලාසි 104 මූලික පරික්ෂණ සිදු කර නොතිබුණි. මේ වන විට අදාල ගෙවීම් වල රිසිට් පත් ලැබී ඇති බැවින් අදාල රිය අනතුරු වල මූලික පරික්ෂණ සිදුකර අවසන්ව ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(ආ) වියදම් කළමනාකරණය**<br><br>මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, තම ඇස්තමේන්තුවට අදාල කෙටුම්පත් ඇස්තමේන්තු රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කරන බවට වගබලා ගැනීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. නමුත් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ සමස්ත පුනරාවර්තන වැය විෂයයන් 17 කින් පුනරාවර්තන වැය විෂයයන් 06 ක් වෙත සලසා තිබුණු රු.මිලියන 6.69 ක ප්‍රතිපාදනය වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සහ මූලධන වැය විෂයක් වෙත අවස්ථා 10 කදී මාරු කර තිබුණි. එසේම මූලධන වැය විෂයක් වෙත සලසා තිබුණු රු.මිලියන 1.95 ක ප්‍රතිපාදන වෙනත් මූලධන වැය විෂයයන් 02 ක් වෙත අවස්ථා 02 කදී මාරු කර තිබූ අතර, පරිපූරක ඇස්තමේන්තු මඟින්ද රු.මිලියන 73.34 ක අමතර ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කිරීමක් සිදුව නොතිබුණි. | පූර්වානුමාන කල හැකි සියළුම සේවාවන් ඇතුලත් කර හැකිතාක් සම්පූර්ණයෙන් නිවැරදි වන ලෙස වාර්ෂික ඇස්තමේන්තු සකස් කල යුතු වේ. | ඇස්තමේන්තු සකස් කිරීමේදී විගණන නිරීක්ෂණ මඟින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව උපරිම සැලකිල්ල යොමු කරමින් හැකිතාක් තාත්වික හා නිවැරදි අයුරින් කටයුතු කොට 2018 වර්ෂය සඳහා රු.මිලියන 689.06 ක ඇස්තමේන්තුවක් සකස් කරන ලදී. එසේ වුවද භාණ්ඩාගාරය මඟින් ප්‍රතිපාදන අනුමත කරන ලද්දේ ආසන්න වශයෙන් ඇස්තමේන්තුවට වඩා රු.මිලියන 326.71 ක් අඩුවෙනි. මෙයින් අතිරේක වශයෙන් නව උපකරණයක් මිල දී ගැනීම සඳහා ඉල්ලුම් කල රු.මිලියන 280 හැර සලකා බලන විට සාමාන්‍ය වැය විෂයයන් සඳහා අනුමත වූයේ රු.මිලියන 46.71 ක් අඩුවෙනි. මෙම හිගය වියදම් පාලනය මඟින් ආවරණය කර ගැනීමට සිදු විය.මෙම වියදම් පාලනය දෙපාර්තමේන්තුවේ කටයුතු වලට බාධාවක් නොවන අයුරින් සිදුකළ යුතු අතර සෑම වැය විෂයක්ම පාලනය කිරීම ප්‍රායෝගික නොවේ. ඒ අනුව පාලනය කළ හැකි වැය විෂයයන් මත වියදම පාලනය කොට ඉතිරි කර ගන්නා ප්‍රතිපාදන වෙනත් අත්‍යවශ්‍ය වැය විෂයයන්ට මුදල් රෙගුලාසි ප්‍රකාරව මාරු කර ඇත. එසේ ප්‍රතිපාදන මාරු කිරීම මඟින් ආවරණය කර ගත නොහැකි අත්‍යවශ්‍ය වියදම් දැරීම සඳහා ඇති එකම විකල්ප ක්‍රියාමාර්ගය වන අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම මඟින් ප්‍රතිපාදන සලසා ගැනීමට මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට ඇත. |

| | | |
|---|---|---|
| **(අ)** පුනරාවර්තන වැය විෂයන් 03 ක හා ප්‍රාග්ධන වැය විෂයන් 02 ක ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන165.12 ක් වූ අතර එම වැය විෂයයන්ගේ ඉතිරිය රු.මිලියන 42.81 ක් වූයෙන් ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 50 දක්වා පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව පූර්වාණුමාන කල හැකි සියළුම සේවාවන් ඇතුලත් කර සම්පූර්ණයෙන් නිවැරදි වන ලෙස වාර්ෂික ඇස්තමේන්තු සකස් කල යුතු වේ. | ඇණවුම් කරන ලද රසායන ද්‍රව්‍යවලින් කොටසක් ගිණුම් වර්ෂය අවසාන වීමට පෙර නොලැබීම, ගොඩනැගිල්ලේ අබලන් වී ඇති දොර ලොක් හා උපාංග අලුත්වැඩියා කිරීම සඳහා සැලසුම් කර තිබුණද වර්ෂ අවසානයට පෙර එම කටයුතු අවසන් කර බිල්පත් ඉදිරිපත් කර නොතිබීම, කුරුණෑගල රසායනාගාරය වසා දැමීම හේතුවෙන් තවදුරටත් බදු කුලිය ගෙවීම අවශ්‍ය නොවීම, ඇස්තමේන්තු වටිනාකමට වඩා ඉදිරිපත් වූ මිල ගණන් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වීම හා ණයවර ලිපි විවෘත කරන ලද **FID** හා **Alcolizer** යන උපකරණ වර්ෂය අවසන් වීමට පෙර නිෂ්කාශනය කර ගැනීමට නොහැකිවීම යනාදී හේතුමත ප්‍රතිපාදන ඉතිරි විය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳි සිටිය යුතුය. එසේම ඒ වෙනුවෙන් දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා සලසා තිබූ ප්‍රතිපාදන මුදල් සීමාව නොඉක්ම විය යුතුය. එහෙත් වැය විෂයයන් 03 කට අදාලව ප්‍රතිපාදන කර තිබූ මුදල ඉක්මවා රු.මිලියන 3.36 ක බැරකම්වලට එළඹ තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන ඇත්නම් විනා වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු වේ. | මෙම වැය විෂයන් වාර්ෂිකව පුනරාවර්තනය වන ස්වභාවයේ සේවාවන් හා සැපයීම් සඳහා අදාල වන වැය විෂයන්ය. මුදල් රෙගුලාසි 94 (11) ප්‍රතිපාදන මගින් දක්වා ඇති සීමාවන්ට යටත්ව අවශ්‍යතාවය සලකා මෙම බැරකම් සඳහා එළඹෙන ලදී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම.

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අධිකරණ විද්‍යා අංශය, ගිනි අවි හා ප්‍රක්ශිප්ත විද්‍යා පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය, මත් ද්‍රව්‍ය අංශය, මස්තු විද්‍යා හා DNA අංශය, අධිකරණ ධූලක විද්‍යා අංශය, සැක කටයුතු ලේඛන, ඩිජිටල් අපරාධ විමර්ශන අංශය, විවිධ නඩු යනාදි වශයෙන් අංශ 07 ක් පැවතුණි. තවද ආහාර, මධ්‍යසාර, කිරි සහ ජලය වෙනුවෙන් වූ විද්‍යාගාර 04 ක් වෙත නඩු කටයුතු සඳහා අධිකරණ මඟින් සමාලෝචිත වර්ෂය තුළදී විශේෂඥ වාර්තා කැඳවීම් 42,166 ක් සිදු කර ඇති බව නිරීක්ෂණය වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට වාර්තා කිරීමට නොහැකිව ඉතිරිව තිබුණු එවැනි වාර්තා සංඛ්‍යාව 6,168 ක්ද විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී අධිකරණය වෙත වාර්තා 36,647 ක් ලබාදී තිබුණු අතර වාර්තා 11,687 ක් ලබාදීමට අපොහොසත් වී තිබුණි. ඒ අනුව ලබාදීමට නොහැකි වූ වාර්තා ප්‍රමාණය පෙර වර්ෂය හා සැසඳීමේදී සියයට 89 කින් වර්ධනය වී තිබුණි. | වාර්ෂික නඩු වැඩිවීම්වලට සාපේක්ෂව නඩු වාර්තා ලබා දීමේ ප්‍රමාණතාවය වැඩි කිරීමේ ක්‍රමවේදයන් හඳුනාගෙන ක්‍රියාත්මක කල යුතුව ඇත. | ශ්‍රී ලංකාවේ සිදු වන සියළුම අපරාධ සම්බන්ධව අධිකරණ විසින් භාරදෙනු ලබන විවිධ නඩු භාණ්ඩ විශ්ලේෂණය කරනු ලබන ශ්‍රී ලංකාවේ තිබෙන එකම ආයතනය වන්නේ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවයි. දෙපාර්තමේන්තුවට අළුතින් එකතු කල DNA සහ විද්‍යුත් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරය සඳහා ලැබෙන නඩු භාණ්ඩ සංඛ්‍යාව ඉහළ යාම, වාර්තා නොකළ නඩු සංඛ්‍යාව ඉහළ යාම සඳහා ද බලපා ඇත. එමෙන්ම, අධිකරණ විද්‍යා අංශයට අයත් විද්‍යාගාර සඳහා ලැබෙන නඩු භාණ්ඩ එකිනෙකට වෙනස් වන අතර ඒ සඳහා එකිනෙකට වෙනස් විශ්ලේෂණ ක්‍රමද භාවිතා කිරීමට සිදු වේ. විශ්ලේෂණ ක්‍රම සකස් කිරීමට වැඩි කාලයක් ගත කිරීමට සිදුවීමද වාර්තා නොකළ නඩු සංඛ්‍යාව ඉහළ යාම සඳහා බලපා ඇත. තවද 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ දී විශ්ලේෂණය සඳහා ලැබුණු නඩු සංඛ්‍යාව සියයට 30 කින් (9778) වර්ධනය වී ඇත.<br>වර්තමානයේ වැඩිම නඩු භාණ්ඩ ප්‍රමාණයක් ලැබෙන්නේ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක අංශයටය. එබැවින්, අනෙකුත් විද්‍යාගාර වලින් ලබාගත් නිලධාරීන් 4 දෙනෙකු මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක අංශයට අනුයුක්ත කිරීමට 2018 වර්ෂයේ දී පියවර ගෙන ඇත. මීට අමතරව නිවාඩු දිනවල වැඩ කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇති අතර 2018 දෙසැම්බර් දක්වා නිවාඩු දින 05 ක් වැඩ කරනු ලබන නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත.<br>මීට අමතරව, සහකාර රස පරීක්ෂක තනතුරු 31 ක් අළුතින් අනුමත කර |

| | | |
|---|---|---|
| | | ගැනීමට කටයුතු කර ඇත. එම තනතුර සඳහා බඳවා ගැනීම් සඳහා වන ගැසට් නිවේදනය මේ වසරේ පළකිරීමට අපේක්ෂා කරන අතර එමගින් වාර්තා නිකුත් කිරීමේ ප්‍රමාදය අවම කර ගැනීමට කටයුතු කල හැකි වේ. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා සුදුසු විගණකවරයෙකු පත් කර නොතිබුණි. කෙසේ වෙතත් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා අභ්‍යන්තර විගණක තනතුරක් 2016 සැප්තැම්බර් 01 දින සිට අනුමත කරගෙන තිබූ අතර අභ්‍යන්තර විගණන සැලසුම පිළියෙල කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා සුදුසු විගණකවරයෙකු පත්කර ගැනීමට කටයුතු කලයුතු අතර අභ්‍යන්තර විගණන සැලසුම් පිළියෙල කිරීමද කල යුතු වේ. | අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා නිලධාරියෙකු පත් කරන ලෙස රාජ්‍ය පරිපාලන හා ආපදා කලමණාකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර ඇත. නිලධාරියෙකු පත් කල වහාම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කටයුතු කරනු ලැබේ. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා හා ආහාර විද්‍යා වශයෙන් ප්‍රධාන අංශ 02 කින් සමන්විත වන අතර එය ලංකාවේ ඇති එකම අධිකරණ විද්‍යා රසායනාගාරය ලෙස ගිනි අවි ප්‍රක්ශිප්ත විද්‍යාව, පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන, මත් ද්‍රව්‍ය, මස්තු විද්‍යා හා DNA, අධිකරණ ධූලක විද්‍යා, සැක කටයුතු ලේඛන හා ඩිජිටල් අපරාධ, විවිධ නඩු, ආහාර, මධ්‍යසාර, කිරි සහ ජලය යන අංශවලින් ලංකාවේ විවිධ | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලට අදාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කිරීම. | ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක තනතුරු ඇතුලත් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් 1 ශ්‍රේණියේ තනතුරු වලට පත්කිරීමට සකස් කර ඇති ගැසට් නිවේදන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.<br>ආණ්ඩුවේ රස පරීක්ෂක තනතුරු පුරප්පාඩු 02 ක් පවතින අතර දැනට |

අධිකරණවල පවතින නඩුවලට අදාල විශේෂඥ වාර්තා සැපයීමට නියමිතව තිබුණි. එහෙත් ජ්‍යෙෂ්ඨ හා තෘතීයික මට්ටමේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 51 ක්වූ බැවින් එකී පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් කාර්යයන් සඳහා සෘජුවම බලපා තිබෙන බව නිරීක්ෂණය විය.

නියෝජ්‍ය රස පරීක්ෂක තනතුරේ ස්ථිරව පත්වී ඇත්තේ නිලධාරීන් දෙදෙනෙකි. අතිරේක රස පරීක්ෂක තනතුරු සඳහා පත්විය හැකි නියෝජ්‍ය රස පරීක්ෂක තනතුරු පුරප්පාඩු පිරවීමට ප්‍රථම නියෝජ්‍ය රස පරීක්ෂක පුරප්පාඩු පිරවීම සිදු කල යුතුය. එබැවින් නියෝජ්‍ය රස පරීක්ෂක තනතුරු පුරප්පාඩු පිරවිමෙන් පසු අතිරේක රස පරීක්ෂක පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

සහකාර රස පරීක්ෂක තනතුරු 32 ක් සඳහා අළුතින් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පරිපාලන) තනතුර සඳහා 2017.07.24 දින සිට කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු පත් කර ඇති අතර එම නිලධාරියාගේ සේවා කාලය 2019.01.01 දින සිට මාස 06 ක් දිර්ඝ කර ඇත.

අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා නිලධාරියෙකු පත් කරන ලෙස රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර ඇත.